② ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2359/34 – 2023 නොවැම්බර් මස 23 වැනි බ්‍රහස්පතින්දා – 2023.11.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2023/20.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

වයි. වී. ඒ. සුදත් වසන්ත මයා, පස්සර පාර, ඌව පැල්වත්ත.

සහ

සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම, පැල්වත්ත ඒකකය, පුද්ගලික තැපැල් මල්ල, බුත්තල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී

ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, පැලවත්ත, සිංහපුර පාර, අංක 117, සිරි සිංගප්පුලි මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 නොවැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2023/20.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

වයි. වී. ඒ. සුදත් වසන්ත මයා, පස්සර පාර, ඌව පැල්වත්ත.

සහ

සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම, පැල්වත්ත ඒකකය, පුද්ගලික තැපැල් මල්ල, බුත්තල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ** වනුයේ,

සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ සේවය කරන වයි. වී. ඒ. සුදත් වසන්ත මහතාට ජ්‍යෙෂ්ඨ ක්ෂේත්‍ර සහකාර S-1 තනතුර හිමි ද, හිමි නම් එය ලබා නොදීමෙන් ඔහුට අසාධාරණයක් සිදු වී තිබේ ද? යන්නත් එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන මොනවාද කවරදා සිට ද යන්නත් පිළිබඳව වේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 - 0251

---

මගේ අංකය: IR/COM/03/2020/271(2).

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

ඒ. ආර්. කරුණාසේන මයා, අංක 364/14, ඇරැව්වල, පන්නිපිටිය.

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, අංක 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගාල්ල, අනගාරික ධර්මපාල මාවත, අංක 32/26එල්, එම්. එම්. අයි. ආර්. ඒ. ජයතිලක මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනුෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 නොවැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2020/271(2).

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ඒ. ආර්. කරුණාසේන මයා, අංක 364/14, ඇරැව්වල, පන්නිපිටිය.

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, අංක 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,**

ඒ. ආර්. කරුණාසේන මහතාට 2004 වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි M-M-1-1-ii ශ්‍රේණියේ ගණකාධිකාරි තනතුර ලබාදීම සුදුසු ද? නැත් ද? යන්නත් ලබාදීම සුදුසු නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 - 0252

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.